# ලංසු ආරාධනාවයි (IFB)

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වන විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත මුද්‍රණය කොට සැපයීම

කොන්ත්‍රාත් අංකය : UGC/ Admin/3/1/12

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පිළිගත් මුද්‍රණ ආයතන වෙතින්, පහත සඳහන් ප්‍රමාණයන් ගෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත මුද්‍රණය කොට සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| | මාධ්‍ය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | සිංහල | 50,000 |
| 02. | දෙමළ | 11,500 |
| 03. | ඉංග්‍රීසි | 2,250 |

2. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

3. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසු කරුවන්හට අවශ්‍ය වැඩිදුර තොරතුරු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/සාමාන්‍ය පරිපාලන වෙතින් දුරකතන අංක 011-2685183 මඟින් ලබා ගත හැකි අතර, කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලන අංශයේදී රාජකාරී දිනවල පෙ.ව. 9.30 හා ප.ව. 3.00 අතර කාලය තුළ අදාල ලංසු ලේඛණ හා නියැදි නොමිලයේ පරීක්ෂා කර බැලිය හැකිය.

4. **අවශ්‍ය සුදුසුකම්:**

   i. වසර තුනක (3) ව්‍යාපාර ලියාපදිංචිය සතු ඕෆ්සෙට් මුද්‍රණ පහසුකම් සහිත මුද්‍රණාල හිමිකරුවන් හට ලංසු ඉදිරිපත් කළ හැකිය.

   ii. භාවිතා කිරීමට අපේක්ෂිත කඩදාසි හා ආර්ට් බෝඩ්, ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව තල හා අනෙකුත් සියලු කොන්දේසි වලට අනුකූල විය යුතුයි.
   ( A4 Paper – 80 GSM, Art Board – 230 GSM)

   iii. මෙම කාර්යය ඉටු කිරීම සඳහා ලංසුකරු සතුව යෝජිත කොන්ත්‍රාත්තුවෙන් 50% ප්‍රමාණයක කාරක ප්‍රාග්ධන ධාරිතාවක් තිබිය යුතුය. (මෙම කරුණ පසුගිය වසරේ 2022/2023 විගණනය කල මූල්‍ය ප්‍රකාශන මඟින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ බැංකුවකින් ලබා ගත් පිළිගත් ලිපියක් මඟින් සනාථ කළ යුතුය.)

   iv. ලංසුකරුවන් විසින් තම ලංසු සමඟ පවත්නා නීති රෙගුලාසි ප්‍රකාරව අදාළ මුද්‍රණ ආයතනය විසින් වැටුප් සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල් ගෙවීම පිළිබඳව අදාළ වන ලේඛණ ඉදිරිපත් කල යුතුයි.

   v. මෙම කාර්යයට සමාන තත්ත්වයේ මුද්‍රණ කටයුතු ( මෙයට පිටු 100 යේ මුද්‍රිත පොත් අයත් විය යුතුය) පසු ගිය වසර 2 තුළ සාර්ථකව සම්පූර්ණ කළ බවට නියැදි හතරක් ( 4 ) ක් ඉදිරිපත් කළ යුතුයි.

vi. කොන්ත්‍රාත්තුව අදාල කාල රාමුව තුළ ඉටු කිරීම සඳහා අදාල මුද්‍රණාලය සතුව නවතම තාක්ෂණය හා භෞතික පරිසරය තිබෙන බවට ලංසුකරු සහතික විය යුතුයි. ( මෙම කර්තව්‍ය සඳහා ලංසුකරු විසින් භාවිත කිරීමට නියමිත මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ විස්තරයක් ලංසුව සමග අමුණා තිබිය යුතුයි.

5. ආපසු නොගෙවන ගාස්තු රු.5,000.00 ( රුපියල් පන් දහසක් ) ගෙවා ලබාගත් නිල ලදු පත ඉදිරිපත් කිරීමෙන් **2024 අප්‍රේල් 1** සිට **2024 අප්‍රේල් 18** දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 අතර කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛණ කට්ටලයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/සාමාන්‍ය පරිපාලන වෙතින් මිළදී ගත හැක. ගෙවීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත මුදලින් ම කළ යුතුවේ.

6. ලංසු පහත සඳහන් ලිපිනය වෙත **2024 අප්‍රේල් 18** දින ප.ව 3.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

7. ලැබී ඇති ලංසු, අදාළ භාර ගැනීම **2024 අප්‍රේල් 18** දින අවසන් කළ වහාම කොළඹ 7, වෝඩ් පෙදෙසේ අංක 20 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව පාලක මණ්ඩල කාමරයේදී විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

8. සියලුම ලංසු සමඟ 2020.10.28 දිනැති යොමු අංක 5. 3. 11 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 36 අතිරේකයෙහි නිර්දිෂ්ඨ නියෝජිතායතනයකින් ලබාගත් රුපියල් 350,000.00 ( තුන් ලක්ෂ පනස් දහසක් පමණයි) වටිනාකමින් යුත් අදාල ලංසු අවසන් වන දින සිට දින 90 දක්වා වලංගු ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. නැතහොත් එම මුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සරප් වෙත ගෙවිය හැක.

9. ලැබී ඇති ලංසු සියල්ලම හෝ යම් ලංසුවක කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සතු වන අතර, අවම ලංසුව පිළිගැනීමට කිසිඳු අයුරකින් බැඳී නැත.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
**2024 මාර්තු 29**